# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 නොවැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 15.75 යි. තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

# 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 25 වන දින.]

එල්.ඩී.— ඕ. 29/97.

**ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද, ජලජ සම්පත් හා ජල ජීවී වගා කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත, 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන, (මෙහි මින් මතු නියමිත දිනය යනුවෙන් හඳුන්වනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය.

## I වන කොටස

## ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

2. (1) මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන, ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන, අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි විය යුතු ය.

3. අධිකාරියේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය:— අධ්‍යක්ෂ මණ්ඩලය.

(අ) අමාත්‍යවරයා විසින්, ධීවර කටයුතු හා ජල ජීවී වගාව, විද්‍යා හා තාක්ෂණය, වාණිජ්‍යය, මුදල් හෝ පරිපාලනය හෝ නීතිය පිළිබඳ පුළුල් පළපුරුද්දක් තිබෙන හා දක්ෂතා පෙන්නුම් කර ඇති තැනැත්තන් අතුරින් පත්

කරන අධ්‍යක්ෂවරයන් අට දෙනෙක්, (මේ ඡේදය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයකු මෙහි මින් මතු "පත් කළ අධ්‍යක්ෂ" යනුවෙන් හඳුන්වනු ලැබේ).

(ආ) මෙහි පහත සඳහන් නිලබලයෙන් පත් වන අධ්‍යක්ෂවරු :—

(i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තු නිලධරයෙක් ;

(ii) වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින්, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයෙක් ;

(iii) මහවැලි සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින් ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයෙක් ;

(iv) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින්, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයෙක් ;

(v) වන ජීවී සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින්, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයෙක් ;

(vi) පරිසර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින්, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයෙක් ; සහ

(vii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින්, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයෙක්.

මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුසුකම්.

4. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ ඒ මන්ත්‍රීවරයකු හෝ සභිකයෙකු ලෙස පත් වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ, සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු බවට ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොකළ බුන්වත් හෝ වස්තුභංගත්වයට පත් තැනැත්තකුව සිටී නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

පත් කළ අධ්‍යක්ෂවරයන් සහ සභාපතිවරයා පිළිබඳ විධිවිධාන.

5. (1) පත් කළ අධ්‍යක්ෂවරයකු විසින්, තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපිය මගින් සිය අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් පිළිගනු ලැබූවිට, එය බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ පත් කළ අධ්‍යක්ෂවරයකු කිසිදු හේතු දැක්වීමකින් තොරව, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, හෝ වෙනත් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට, යම් පත් කළ අධ්‍යක්ෂවරයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, 3 වන වගන්තියේ විධිවිධාන ගැන සැලකිලිමත් ව, ඒ කාලය තුළ ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) පත් කළ අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය, (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක් විය යුතු ය.

(5) කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කරන පත් කළ අධ්‍යක්ෂවරයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(6) පත් කළ අධ්‍යක්ෂවරයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් කළ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ වෙනුවට වෙනත් අධ්‍යක්ෂවරයකු 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා, ඔහු අනුප්‍රාප්තවන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් අතුරින්, මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(8) මණ්ඩලයේ සභාපතිවරයා විසින්, තමා සභාපති ධුරයෙන් ඉල්ලා අස්වන බවට, අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබූ විට, බලාත්මක වන්නේ ය.

(9) අමාත්‍යවරයා විසින්, හේතු කිසිවක් නොදන්වා ඕනෑම වේලාවක දී මණ්ඩලයේ සභාපතිවරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(10) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා මණ්ඩලයේ සභාපතිවරයාට තම ධුරයේ කාර්ය තාවකාලිකව ඉටුකිරීමට නොහැකිවන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(11) (8) වන හා (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

6. (1) මණ්ඩලය යටත් පිරිසෙයින් මාසයකට එක් වරක්වත් රැස්විය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලය විසින්, (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන්, කාර්ය විධානය විධිමත් කර ගත හැකි ය.

7. මණ්ඩලය විසින් භාර ගන්නා හෝ කරනු ලබන නැතහොත් භාර ගැනීමට හෝ කිරීමට යෝජිත යම් ව්‍යාපෘතියකට, කටයුත්තකට හෝ කොන්ත්‍රාත්තුවකට මුල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් කෙලින්ම හෝ වක්‍රව සම්බන්ධතාවක් දරන අධ්‍යක්ෂවරයකු විසින්, හැකි පළමු අවස්ථාවේ දී, තමාගේ සම්බන්ධතාව, මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු ය. එම හෙළිදරව් කිරීම, මණ්ඩලයේ වාර්තාවෙහි වාර්තාගත කළ යුතු අතර, මණ්ඩලය විසින් අන්‍යාකාරව විධානයක් කළහොත් මිස, ඒ අධ්‍යක්ෂවරයා විසින් ඉන් පසුව ඒ ව්‍යාපෘතිය, කටයුත්ත හෝ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් මණ්ඩලයේ සිදු කෙරෙන සලකා බැලීමකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය. සම්බන්ධතා හෙළිදරව් කළ යුතු බව.

8. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයේ පාරිශ්‍රමික මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන්ට ගෙවනු ලැබිය හැකි ය. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික.

9. අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ අධ්‍යක්ෂවරයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක්, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල වන්නාක් සේ නොසැලකිය යුතු ය. පුරප්පාඩුව හේතුවෙන් මණ්ඩලයේ කටයුතු නිර්බල නොවන බව.

10. (1) අධිකාරියට පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. ඒ මුද්‍රාව, මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය. අධිකාරියේ මුද්‍රාව.

(2) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර අධිකාරියේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන්, ඒ දෙදෙනා විසින් ම ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වා ගත යුතු ය.

අධිකාරියේ කර්තව්‍ය.

11. අධිකාරියේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය.

(අ) රටේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණ ඇතිව, ජලජ සම්පත් සහ ජල ජීවී වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම ;

(ආ) මිරිදිය ජල ජීවී වගාව වැඩිදියුණු කිරීම මගින් සහ වෙරළ බඩ ජල ජීවී වගාව හා සාමුද්‍රිය වගාව වැඩිදියුණු කිරීම මගින් රැකියා අවස්ථා ඇතිකර ගැනීම ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) අපනයනය සඳහා විසිතුරු මත්ස්‍ය විශේෂ ඇතුළුව වැඩි වටිනාකමක් ඇති මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) පරිසරයට හිතකර ජල ජීවී වගා වැඩසටහන් මගින්, ජලජ සම්පත් උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) ජල ජීවී වගාව සඳහා පෞද්ගලික අංශයේ සුළු, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම ;

(ඊ) ජලජ සම්පත් හා ජල ජීවී වගා කර්මාන්තය කළමනාකරණය, සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම ;

(උ) ජලජ සම්පත් ආනයනකරුවකු, අපනයනකරුවකු, අලෙවිකරුවකු, සපයන්නකු හා බෙදාහරින්නකු ලෙස ව්‍යාපාරය කරගෙන යාම ;

(ඌ) ජල ජීවී වගාව සහ ජලජ සම්පත් කළමනාකරණය හා සංවර්ධනය සඳහා සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(එ) ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම.

අධිකාරියේ බලතල සහ කාර්ය.

12. ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා, අධිකාරිය විසින් පහත සඳහන් බලතල සහ කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කරනු ලැබිය හැකි ය:—

(අ) ජලජ හා භූමි සම්පත්, ජල ජීවී වගාව සඳහා සංවර්ධනය කිරීමට තිබෙන ඉඩකඩ නිශ්චිතව දැන ගැනීම සඳහා පර්යේෂණ හා සම්පත් සමීක්ෂණ ආරම්භ කර පැවැත්වීම;

(ආ) ජලජ සම්පත් හා ජල ජීවී වගාව පිළිබඳ තොරතුරු එකතු කර බෙදා හැරීම ;

(ඇ) ජල ජීවී වගා මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඈ) ජල ජීවී වගාවෙහි සහ ජලජ සම්පත් වර්ධනයෙහි නියුක්ත ව්‍යවසායකයන්ට තාක්ෂණික වශයෙන්, මුදලින් හෝ අන්‍යාකාරයෙන් සහාය වීම සහ රට අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන්ට හා මත්ස්‍ය ගොවීන්ට මූල්‍ය, තාක්ෂණික, හෝ කළමනාකාර සහාය සැපයීම ;

(ඉ) යම් වැවල හෝ නිශ්වල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට, උකසට හෝ කුලියට දීම හෝ විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම :

එසේ වුවද අධිකාරියේ කිසිම නිශ්චල දේපළක්, අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව නොවිකිණිය යුතු ය.

(ඊ) අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා සහ සපයනු ලබන පහසුකම් හා උපකරණ සඳහා ගාස්තු හෝ වෙනත් වියදම් නියම කර අයකර ගැනීම ;

(උ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු සමග, කෙළින්ම හෝ තත් කාර්යය සඳහා බලය දී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ හවුල් ව්‍යවසායක් වශයෙන්, අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වියහැකි සියලු ගිවිසුම් හෝ පොරොන්දු පත්‍රවලට ඇතුළත්වීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම ;

(ඖ) (i) අධිකාරියේ කටයුතු පරිපාලනය;

(ii) අධිකාරියේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ සේවා කොන්දේසි හා නියමයන් සහ විනය පාලනය ;

(iii) අධිකාරිය විසින් අරමුදලින් මුදල් ආපසු ගැනීම හෝ වැය කිරීම

සම්බන්ධයෙන්, රීති, කාර්ය පටිපාටි සහ යෝජනා ක්‍රම සකස් කිරීම ;

(එ) අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රයෝජනය පිණිස, අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක වීම ;

(ඒ) අධිකාරියේ කර්තව්‍ය නිසි පරිදි ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි දෙපාර්තමේන්තු, අංශ සහ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම ;

(ඔ) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටුකර ගැනීම පිණිස අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි අධිකාරියේ බලතල අතුරින් යම් බලතල අධිකාරියේ සභාපතිවරයාට හෝ යම් අධ්‍යක්ෂවරයකුට හෝ යම් නිලධරයකුට පවරා දීම ;

(ඕ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර මුදල් භාර ගැනීම සහ ඒවා අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා යොදාගැනීම ;

(ක) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට, අධිකාරියේ මුදල්, ආයෝජනය කිරීම ;

(ග) යම් සමාගමකට, සංගමයකට හෝ ව්‍යාපාරයකට අධිකාරිය විසින් ඉටුකරන ලද යම් සේවයක් සඳහා හෝ අධිකාරිය විසින් කරන ලද යම් විකිණීමක්,

නැතහොත් ඒ යම් සමාගමකින්, සංගමයකින් හෝ ව්‍යාපාරයකින් අධිකාරිය වෙත අයවිය යුතු යම් ණයක් වෙනුවෙන්, සම්පූර්ණයෙන් ගෙවීම් වශයෙන් හෝ ගෙවීමෙහි කොටසක් වශයෙන් අධිකාරියේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමට හෝ දියුණු කිරීමට හැකි එවැනි යම් සමාගමක, සංගමයක හෝ ව්‍යාපාරයක ස්කන්ධ හෝ කොටස් හෝ සෘණපත්‍ර හෝ වෙනත් සුරැකුම්පත් පිළිගැනීම; සහ

(ඩ) අධිකාරියේ පරමාර්ථ සහ කර්තව්‍යයන් සපුරාලීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය බව මණ්ඩලයේ මතය වන වෙනත් සියලු දේ කිරීම.

## II වන කොටස

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**13.** (1) මණ්ඩලය විසින් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයා පත්කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු අතර, මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි හෝ අභිනියෝජනය කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්ය ඔහු විසින් ඉටුකරනු ලැබිය යුතු ය.

අධිකාරියේ සෙසු කාර්ය මණ්ඩලය.

**14.** (1) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයන් සහ සේවකයන්, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට, මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් සහ සේවකයන්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු අතර, ඔවුන්ට මණ්ඩලය නිශ්චය කරන ගෙවීම් ප්‍රමාණයක් මත ගෙවීම කළ යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

15. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද ඒ නිලධරයා සේවයේ නියුක්තව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය, නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු, අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ, 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු, අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ගිවිසුමකට ඇතුළත් වී සිටින තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා අධිකාරියෙහි සේවය කරන යම් කාලසීමාවක්, ආණ්ඩුවට සේවය කරන ලද කාලසීමාවක් ලෙස ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා සැලකිය යුතු ය.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ජල ජීවී වගා සංවර්ධන අංශයේ රජයේ නිලධරයන් විසින් නිවේදනයක් දිය යුතු බව.

16. (අ) මේ කොටසෙහි "අංශය" යනුවෙන් සඳහන් කරනු ලබන, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ජල ජීවී වගා සංවර්ධන අංශයේ, ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයකට අයත් නොවන සෑම රජයේ නිලධරයකු විසින්ම, නියමිත දිනයේ දී ඔහු–

(i) ඒ අංශයේ විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන්, ඒ දිනයේ දී ඔහු අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර තිබේනම්, රජයේ සේවයෙන් විශ්‍රාම ලබා අධිකාරියේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(ii) ඒ අංශයේ විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනයේ දී ඔහු අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර තිබේනම්, රජයේ සේවයෙන් ඉවත් වී අධිකාරියේ සේවා නියුක්තයකු වීමට; හෝ

(iii) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකු වේ නම්, රජයේ සේවයෙන් ඉවත් වී අධිකාරියේ සේවා නියුක්තයකු වීමට; හෝ

(iv) රජයේ සේවයෙන් විශ්‍රාම ලබා හෝ ඉවත් වී අධිකාරියේ සේවා නියුක්තයකු නොවීමට

අදහස් කරන බවට, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, මේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන දිනයෙන් පසුව එහෙත් නියමිත දිනට පෙර, ලියවිල්ලකින් නිවේදනයක් කළ යුතු ය.

(ආ) නියමිත දිනයට පෙර, (අ) ඡේදය යටතේ, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එම අංශයේ රජයේ නිලධරයකු විසින් කරන ලද නිවේදනය අවසානාත්මක වන්නේ ය.

16 වන වගන්තිය යටතේ නිවේදනයක් නොදීමේ ප්‍රතිඵලය.

17. 16 වන වගන්තියේ (අ) ඡේදයේ (i), (ii), (iii) හෝ (iv) වන අනුඡේද යටතේ, නියමිත දිනයට පෙර නිවේදනයක් නොදෙන, අංශයේ යම් රජයේ නිලධරයෙක්, එම දිනයේ සිට හා ඉන් පසුව, අංශයේ රජයේ නිලධරයකු ලෙස තවදුරටත් ධුරය දැරීම අවසන් වන්නේ ය.

16 වන වගන්තිය යටතේ නිවේදනයක් දීමේ ප්‍රතිඵලය.

18. (1) 16 වන වගන්තියේ (අ) ඡේදයේ (i) හෝ (ii) හෝ (iii) හෝ (iv) වන අනුඡේද යටතේ, නියමිත දිනයට පෙර, නිවේදනයක් කරන අංශයේ යම් රජයේ නිලධරයෙක් :—

(අ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (i) වන අනුඡේදය යටතේ වන අවස්ථාවක, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව, අධිකාරියේ සේවා නියුක්තයකු

වන අතර, 19 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය.

(ආ) ඔහු විසින් ඒ නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ වන අවස්ථාවක දී නම්, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව අධිකාරියේ සේවා නියුක්තයකු වන අතර, 19 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ දිනයේ දී රජයේ සේවයෙන් ඉවත් වූවාක් සේ සැලකෙන අතර, ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලබන දීමනාව ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය.

(ඇ) ඔහු විසින් ඒ නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iii) වන අනුඡේදය යටතේ වන අවස්ථාවක, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව අධිකාරියේ සේවා නියුක්තයකු වන අතර, සේවයෙන් පහ කිරීමේ හේතුව මත නොව ආණ්ඩුවේ කැමැත්ත ඇතිව, ගිවිසුමක් අවසාන කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(ඇ) ඔහු විසින් ඒ නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iv) වන අනුඡේදය යටතේ වන අවස්ථාවක :—

(i) ඔහු ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් පන්තියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු නම්, නියමිත දිනයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත, ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබෙන විශ්‍රාම වැටුපම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය.

(ii) ඔහු ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් පන්තියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු නම්, නියමිත දිනයේ දී රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලබන දීමනාවම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය:

(iii) ඔහු, ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් පන්තියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ කාර්ය සඳහා සේවයෙන් පහ කිරීමේ හේතුව හැර ඔහු ඒ දිනයේ දී ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (i) වන උපවගන්තියේ විධිවිධාන සහ පනතේ වෙනත් යම් විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වූ විටක, ඒ ගැටුමේ හෝ අනනුකූලතාවේ ප්‍රමාණයට, ඒ උපවගන්තියේ විධිවිධාන, ඒ වෙනත් විධිවිධාන අභිභවා බලපවත්වන්නේ ය.

අධිකාරියේ ඇතැම් සේවා නියුක්තයන්ට අදාළ විශේෂ විධිවිධාන.

19. 18 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම නිසා, නියමිත දිනයේ දී අධිකාරියේ සේවා නියුක්තයකු බවට පත්වන යම් සේවා නියුක්තයකුට සහ ඒ සේවා නියුක්තයකු සම්බන්ධයෙන්, පහත දැක්වෙන විධිවිධාන අදාළ වන්නේ ය.

(අ) ඒ සේවා නියුක්තයා සහ අධිකාරිය එකඟ වන නියමයන් සහ කොන්දේසි මත, ඒ සේවා නියුක්තයා අධිකාරිය විසින් සේවයේ නියුක්ත කළ යුතු ය :

එසේ වුවද, ඒ නියමයන් සහ සේවා කොන්දේසි, ඒ සේවා නියුක්තයා අංශයේ කලින් සේවයේ නියුක්ත කරනු ලැබුවේ යම් නියමයන් හා කොන්දේසි මත ද ඒ නියමයන්ට හා කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවිය යුතු ය.

(ආ) නියමිත දිනයේ දී ඒ සේවා නියුක්තයා, අංශයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශිත තනතුරක් දරමින් සිටි සහ අවුරුදු දහයකට අඩු එහෙත් අවුරුදු අටකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර ඇති රජයේ නිලධරයකු වී නම්,

(i) ආඥාවට යටතේ ඔහුගේ විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට යම් කාලයක් එකතු කළ විට අවුරුදු දහයක විශ්‍රාම වැටුප් සහිත සමස්ත සේවා කාලසීමාවක් සම්පූර්ණ වන විටක, නියමිත දිනයේ දී අංශයෙහි ඔහු දැරූ තනතුර, ඒ කාලසීමාව දක්වා දරමින් සිටි ලෙස, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා පමණක් සලකනු ලැබිය යුතු ය. (ඒ සමස්ත කාලසීමාව ආගණනය කිරීම සඳහා, අධිකාරිය යටතේ සේවය ආඥාව යටතේ විශ්‍රාම වැටුප් සහිත සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය) ;

(ii) නියමිත දිනයේ දී ඔහු අංශයේ දැරූ තනතුර, යම් කාලසීමාවක් තුළ ඔහු විසින් දරන ලද්ද බව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සලකනු ලබන විට, ඒ කාලසීමාවේ එක් එක් සම්පූර්ණ මාසය වෙනුවෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදලක්, ඔහු වෙනුවෙන්, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස අධිකාරියේ අරමුදලින් අධිකාරිය විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය ;

(iii) (i) වන අනුඡේදයේ සඳහන් කාලසීමාව අවසානයේ දී, ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සැලකිය යුතු අතර, එම කාලසීමාව අවසානයේ දී, තනතුර අහෝසිවීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, ඔහුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය.

## III වන කොටස

### මුදල්

20. (1) අධිකාරියට, අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදලට පහත දැක්වෙන මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබිය යුතු ය :— අධිකාරියේ අරමුදල.

(අ) පාර්ලිමේන්තුව විසින් අධිකාරියේ ප්‍රයෝජනය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම දිනයේ දී, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ජල ජීවී වගා සංවර්ධන අංශයේ බැරට ඇති සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) අධිකාරිය විසින් මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ;

(ඈ) ගාස්තු හා අයකිරීම් වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ;

(ඉ) ණය, පරිත්‍යාග, සහනාධාර, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කවර හෝ ප්‍රභවයකින් අධිකාරියට ලැබිය හැකි සියලු මුදල්.

(2) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍යවන සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

21. අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය, රුපියල් මිලියන පණහක් විය යුතු ය. ආරම්භක ප්‍රාග්ධන මුදල, ඒකාබද්ධ අරමුදලින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, අමාත්‍යවරයා විමසා නිශ්චය කරන පරිදි වූ වාරිකවලින් අධිකාරියට ගෙවනු ලැබිය යුතු ය. ආරම්භක ප්‍රාග්ධනය.

අධිකාරිය බදු යනාදිය ගෙවීමෙන් නිදහස් වියයුතු බව.

22. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, අධිකාරිය—

(අ) අධිකාරියේ ආදායම, ලාභ හෝ වෙනත් ලැබීම් මත බදු අයකිරීමකින් ; සහ

(ආ) මේ නිදහස් කිරීම නොවීනිනම්, අය කරනු ලැබිය හැකි මුද්දර ගාස්තුව ගෙවීමට අධිකාරිය බැඳී සිටින හා අධිකාරිය විසින් හෝ වෙනුවෙන් හෝ අධිකාරිය නමට හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් මත යම් මුද්දර ගාස්තුවක් ගෙවීමෙන්,

නිදහස් විය යුතු ය.

(2) අධිකාරිය විසින් එහි අරමුදලින් මිල දී ගන්නා හෝ ආනයනය කරන යම් භාණ්ඩ ආනයනය කිරීම අධිකාරියේ අරමුණුවල දියුණුව සඳහා හිතකර බව සැලකේ නම්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධිකාරිය, ඒ භාණ්ඩ සඳහා රේගු බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ සහ වෙනත් යම් තැනැත්තකු අතර ගිවිසුමක් අන්තර්ගත හා අධිකාරිය විසින් සපයන ලද හෝ සපයනු ලබන සේවාවන් සඳහා හෝ අධිකාරියේ වැඩවලට පිටුබලයක් වන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, අධිකාරිය මෙන්ම ඒ වෙනත් තැනැත්තා ද ඒ සාධන පත්‍රය මත යම් මුද්දර ගාස්තුවක් ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

(4) අධිකාරිය විසින් සපයන ලද සේවාවන් සඳහා හෝ අධිකාරියේ අරමුදලට දායක වීමක් වශයෙන්, යම් ගෙවීමක් කරන තැනැත්තකු විසින් එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය, එම ගෙවීම ඇත්ත වශයෙන් කරන වර්ෂය සඳහා ඒ තැනැත්තාගෙන් ආදායම් බදු වශයෙන් අයවිය යුතු මුදල ගණන් බැලීමේ කාර්ය සඳහා අවකරණය කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

(5) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කුමක් සඳහන් ව තිබුණ ද මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

**23.** මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී අධිකාරියේ වගකීම් ඉටු කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය වියහැකි මුදල් ප්‍රමාණය මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ අමාත්‍යවරයා විසින් දෙන ලද පොදු බලයක නියමයන්ට අනුකූලව, අයිරාවක් වශයෙන් හෝ අන්‍යාකාරයකින්, තාවකාලිකව ණයට ගැනීම කළ හැකි ය : අධිකාරිය සතු ණයට ගැනීමේ බලතල.

එසේ වුවද මේ වගන්තිය යටතේ මණ්ඩලය විසින් ණයට ගන්නා ලද යම් මුදලක් සම්බන්ධයෙන් ගෙවීමට හිඟව තිබෙන මුළු මුදල, කිසිම අවස්ථාවක, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරන මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

**24.** ලිත් වර්ෂය, අධිකාරියේ මුදල් වර්ෂය විය යුතු ය. අධිකාරියේ මුදල් වර්ෂය.

**25.** (1) අධිකාරියේ ආදායම හා වියදම සම්බන්ධයෙන් සහ වත්කම් හා බැරකම් හා අධිකාරියේ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නියි ගිණුම් පොත්පත් තබා ගැනීමට සැලැස්විය යුතු ය. අධිකාරියේ ගිණුම් විගණනය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**26.** 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අධිකාරියට අදාළ වන බව, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. 1971 අංක 38 දරන මුදල් පනත අදාළ වීම.

## IV වන කොටස

## පොදු විධිවිධාන

**27.** අමාත්‍යවරයා විසින්, අධිකාරියේ සියලු ක්‍රියා හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සහ මුදල් තත්වය සම්බන්ධයෙන් කලින් කල ඉල්ලා සිටිනු ලැබිය හැකි තොරතුරු, මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත සැපයිය යුතු ය: අමාත්‍යවරයා වෙත තොරතුරු සැපයීම.

-3

අමාත්‍යවරයාගේ විධාන.

**28.** අධිකාරියේ බලතල ක්‍රියාවේ යෙදවීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් පොදු විධාන ද මණ්ඩලය විමසීමෙන් පසුව මණ්ඩලයට විශේෂ විධාන ද දෙනු ලැබිය හැකි ය. එවැනි විධාන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

අධිකාරියේ කටයුතු පිළිබඳව විමර්ශනයක් කරන ලෙස නියම කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

**29.** අමාත්‍යවරයා විසින් නිශ්චිතව නියම කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින්, අධිකාරියේ සියලු කටයුතු හෝ ඒ අතුරින් කිසිවක් පිළිබඳව විමර්ශනය කර වාර්තා කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය විය හැකි සියලු තොරතුරු සහ සියලු පහසුකම් මණ්ඩලය විසින් සලස්වනු ලැබිය හැකි ය.

රජයේ දේපළ හා ගිවිසුම් අධිකාරියට පැවරීම.

**30.** (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරන නියමයන් මගින්,

(අ) මේ පනත යටතේ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අධිකාරයට අවශ්‍ය, රජයේ යම් චංචල හෝ නිශ්චල දේපළක් ; සහ

(ආ) අධිකාරියේ යම් කර්තව්‍යයක් හා සම්බන්ධ, රජයේ යම් ගිවිසුමක් හෝ බැඳීමක්,

අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය.

(2) රජයේ කිසිම චංචල දේපළක්, ගිවිසුමක් හෝ බැඳීමක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා ගේ එකඟත්වය නොමැතිව, (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත නොපැවරිය යුතු ය.

(3) රජයේ කිසිම නිශ්චල දේපළක් රජයේ ඉඩම් විෂයය පවරනු ලැබ සිටින අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත නොපැවරිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නියමයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට ඒ නියමයේ දින සිට,

(අ) ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන දේපළ, අධිකාරිය වෙත පැවරි අධිකාරියේ දේපළ බවට පත් වන්නේ ය.

(ආ) ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන ගිවිසුම්, අධිකාරියේ ගිවිසුම් ලෙස සැලකිය යුතු අතර, ඒ ඒ ගිවිසුම් යටතේ පවත්නා, රජයේ සියලු අයිතිවාසිකම් හා බැදීම් අධිකාරියේ අයිතිවාසිකම් හා බැදීම් ලෙස සැලකෙන්නේ ය.

(ඇ) ඒ නියමයේ නිශ්චයකොට දැක්වෙන වගකීම් අධිකාරියේ වගකීම් ලෙස සැලකෙන්නේ ය.

31. (1) මණ්ඩලය විසින්, ලියවිල්ලක් මගින් නිශ්චය කොට දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, අධිකාරිය වෙත පැවරී ඇති, පැනවී ඇති හෝ නියම වී, ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, අධිකාරියේ සභාපතිවරයාට, මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුට හෝ අධිකාරියේ යම් නිලධරයකුට පවරා දිය හැකි ය. අධිකාරියේ බලතල පැවරීම.

(2) එවැනි පවරා දීමක් කර තිබුණ ද, මණ්ඩලය විසින් ඒ යම් බලයක්, කාර්යක් හෝ කර්තව්‍යයක් , ක්‍රියාවේ යෙදීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

32. (1) මණ්ඩලය විසින් හෝ මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලක් මගින් යථා පරිදි බලය පවරනු ලැබූ අධිකාරියේ නිලධරයකු විසින්, ලියවිල්ලක් මගින් කරන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනත යටතේ අධිකාරියේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමට හා ඉටු කිරීමට මණ්ඩලයට හැකිවනු පිණිස අවශ්‍ය විය හැකි, ඒ දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන යම් කාරණා සම්බන්ධයෙන් යම් තැනැත්තකු දන්නා සියලු තොරතුරු, මණ්ඩලය වෙත හෝ ඒ නිලධරයා වෙත සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය. තොරතුරු ඉල්ලා සිටීමට අධිකාරියට බලය ඇති බව.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම හිතාමතාම පැහැර හරින ; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක් මගින් යම් තොරතුරක් සපයන ලෙස නියම කරනු ලැබූ විට, අසත්‍ය බව තමා දන්නා යම් තොරතුරක් සපයන ; හෝ

(ඇ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කරමින් සපයන යම් තොරතුරක යම් කාරණයක් හිතා මතා අත්හරින

යම් තැනැත්තෙක්, මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා නිශ්චල දේපළ අත් පත් කර ගැනීම.

**33.** (1) අධිකාරියේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍යව ඇත්තා වූ සහ යෝජිත අත්කර ගැනීම, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරන්නා වූ අවස්ථාවක, ඒ දේපළ පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය සේ සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කරගෙන අධිකාරියට පවරා දිය යුතු ය.

(2) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා යම් නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු වන යම් මුදල් ප්‍රමාණයක්, අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**34.** අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අධිකාරියේ අධ්‍යක්ෂවරුන්, නිලධරයන් සහ සේවකයන්, රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**35.** අධිකාරියේ සියලුම අධ්‍යක්ෂවරුන්, නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා, රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**36.** (1) (අ) අධිකාරිය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එයට විරුද්ධව, හෝ

(ආ) මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකු හෝ අධිකාරියේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ

කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව, හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොහැකි විය යුතු ය.

(2) අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට ගෙන එනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ හෝ කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව වූ යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී දරන ලද යම් වියදමක්, ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ වියදම් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගෙන නොමැතිනම්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**37.** (1) (අ) ජල ජීවී වගාව කළමනාකරණය සම්බන්ධයෙන් ; නියෝග.

(ආ) ජලජ සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් ;

(ඇ) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කරුණු සම්බන්ධයෙන්

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චයකොට දැක්වෙන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) ඒ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබුවේ යයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු ය.

1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**38.** 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 18 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) "නියි බලධරයා" යන්නෙන් අර්ථ කථනයේ 'ඊ' ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඊඊ) ඒ ඉඩමක් ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ද";

(ආ) අවස්ථාවෝචිත පරිදි රජයේ ඉඩම් යන්නෙහි අර්ථකථනයේ "1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත" යන වචන හා ඉලක්කම් වෙනුවට, 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත හෝ 1998 අංක .............. දරන ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

අන්තර්කාලීන විධිවිධාන.

**39.** (1) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ (මෙහි මින් මතු "අංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජල ජීවී වගා සංවර්ධන අංශයේ කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද සියලු චංචල හෝ නිශ්චල දේපළ, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සියලු බැඳීම්වලින් නිදහස්ව, අධිකාරිය වෙත සතු වන්නේ ය.

(2) අංශය සඳහා සහ වෙනුවෙන්, රජය විසින් හෝ රජය සමඟ, ඇතුළත් වී තිබෙන, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලු ගිවිසුම් සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා ඇතුළත් වී තිබෙන, අමාත්‍යංශයේ මිරිදිය ධීවර සංවර්ධන අංශය විසින්

ප්‍රයෝජනයට ගන්නා යම් චංචල හෝ නිශ්චල දේපළවලට අදාළව, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලු බදු ගිවිසුම්, අධිකාරිය විසින් හෝ අධිකාරිය සමග ඇතිකර ගන්නා ලද ගිවිසුම් හෝ බදු ගිවිසුම් ලෙස, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව, සලකනු ලැබිය යුතු ය.

(3) අංශය නියෝජනය කරන තැනැත්තා වශයෙන් නීතිපතිවරයා විසින් හෝ නීතිපතිවරයාට විරුද්ධව පවරනු ලැබ, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා සියලු නඩු හා නඩු කටයුතු, අවස්ථාවෝචිත පරිදි අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ පවරන ලද නඩු හා නඩු කටයුතු ලෙස, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා පවත්වාගෙන ගොස් සම්පූර්ණ කරනු ලැබිය හැකි ය.

(4) අංශය නියෝජනය කරන තැනැත්තා වශයෙන් නීතිපතිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව සටහන් කරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉටු නොවී පවත්නා සියලු නඩු තීන්දු හා ආඥා අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ වාසියට හෝ ඊට විරුද්ධව කරන ලද නඩු තීන්දු හා ආඥා ලෙස, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා පවත්වාගෙන ගොස් බලාත්මක කරනු ලැබිය යුතු ය.

**40.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**41.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස :—

අර්ථ නිරූපණය.

"ජලජීවී වගාව", ජලජීවී වගා ව්‍යවසාය, ජලජ සම්පත් මත්ස්‍යයන්, ධීවර බෝට්ටු, ධීවර මෙහෙයුම් සහ අභ්‍යන්තර ජල ප්‍රදේශ" යන යෙදුම් සඳහා 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ ඒ යෙදුම්වලට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"පළාත් සභා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.